# මාක්ස්වාදයේ, භෞතිකවාදයේ හා යථාර්ථවාදයේ දරිද්‍රතාවය

අන් සියල්ලට ම වඩා දර්ශනය ප්‍රධාන වෙයි. ඕනෑම චින්තනයක් සතු ඥානවිභාගයක්, දාර්ශනික ආකල්ප, න්‍යායයක් (ලොජික්) වෙයි. දැනුම නිර්මානය කෙරෙන්නේ චින්තනයක් පදනම් කරගනිමින් ය යන්න අප බටහිරින් ලබාගත් දෙයක් නොව අපේ නිර්මාණයකි. අපේ දැනුමක් නිර්මාණයකිරීමට උත්සාහ කරන අපි පසුගිය විසිවසරක පමණ කාලයක් තිස්සේ මාක්ස්වාදය, භෞතිකවාදය හෙවත් ද්‍රව්‍යවාදය (මෙටීරියලිසම්), යථාර්ථවාදය ආදිය දිගින් දිගට ම විවේචනය කෙළෙමු. එහි ලා අප විසින් ලියන ලද ලිපිවල ද, එයට අමතරව මගේ ලෝකය, අපෝහකයේ රූපිකය, මාක්ස්වාදයේ දරිද්‍රතාව ආදි පොත්වල ද, ඒ කරුනු විටින් විට ඉදිරිපත් කර ඇත. මෙරට මාක්ස්වාදයේ හා ඊනියා භෞතිකවාදයේ හා ඊනියා යථාර්ථවාදයේ උරුමකරුවන් ලෙස පෙනී සිටින කන්ඩායම් කිහිපයකට ම අප පෙන්වා දී ඇති කරුණු නිෂේධකිරීමට නොහැකි විය. එහෙත් අවුරුදු ගණනාවකට පසුව නැවතත් ප්‍රශ්නය කළඑළියට පැමිණ ඇත. අද මාක්ස්වාදියෝ, යථාර්ථවාදියෝ භෞතිකවාදයෝ ආදී එකී නොකී පිරිස් පරළ වී නන්දොඩවති. ඔවුන්ට අද ප්‍රශ්නය වී ඇත්තේ මට පිළිතුරක් දීගත නොහැකි වීම ය. එයට හේතුව මා විසින් අපේ චින්තනය මත පදනම් ව ගොඩනගනු ලැබ ඇති ප්‍රවාදවල ඇති ශක්තිය ය. ඒ ශක්තිය මගේ ශක්තියක් නොව සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ශක්තිය ය.

කණ්ඩායම් කිහිපයකට ම එකවර ප්‍රශ්නය දැනෙන්නට ඇත්තේ ඔවුන්ගේ ඊනියා භෞතිකවාදී පදනම දැන් දියවී යමින් පවතින බැවිනි. මේ කණ්ඩායම් අතර ඊනියා යථාර්ථවාදීන් (හේතුවාදීන්) වික්‍රමබාහු කරුණාරත්නගෙන් තමන් ගලවා ගැනීමට ඉදිරිපත්වන ලෙස ඉල්ලා සිටියේ යැයි ඔහු ම කියයි. ඔහුට අනුව ඔහු මගේ ලෝකයට පිළිතුරු දී අවසන් ය. එසේ කර ඇත්තේ කලකට පෙර මහනුවර දී පවත්වන ලද සමුළුවක දී යැයි ඔහු කියයි. එහි දී බෞද්ධ දර්ශනය පිළිබඳ මහාචාර්යවරු මා විඥානවාදියකු යැයි ද මිථ්‍යාදෘෂ්ටිකයකු යැයි ද කීවේ යැයි වික්‍රමබාහු කරුණාරත්න කියයි. එසේ කියන ලද්දේ කවුරුන් විසින් දැයි ඔහු කියන්නේ නම් මැනවි. මගේ කණට ඇසෙන්නට නම් කිසිවකු එසේ කියා නැත. ඒ සම්මේලනයේ වාර්තාව පොතක් ලෙස පළ වී ඇත. ඒ පොතෙහි වික්‍රමබාහු කරුණාරත්න කියන කිසිවක් නැත. ඔහුගේ සුදානම මා විසින් ගොඩනංවනු ලැබ ඇති දර්ශනය (ඥානවිභාගය) බුදු දහමට පටහැණි බව බෞද්ධ දර්ශනය පිළිබඳ දැන උගත් අයගේ මතය යැයි කීමට ය. එහෙත් මේ පිළිබඳ ව නම් ගම් සහිතව ඔහු ඉදිරිපත්කරන්නේ රත්නපුරේ රාහුල හිමියන් මගේ ලෝකය පිළිබඳ ව ලියා ඇති දීර්ඝ ලිපිය පමණ ය. ඒ ලිපිය මගේ ලෝකය කෘතියෙහි දෙවැනි හා තුන්වැනි මුද්‍රණවල උපග්‍රන්ථ ලෙස පළ වී ඇත. වික්‍රමබාහු කරුණාරත්නට ඊනියා හේතුවාදීන් තබා තමන් ද ගලවාගැනීමට නො හැකි ය. ඔහුට ඊනියා භෞතිකවාදී ස්ථාවරයකින් මට පිළිතුරු දීමට නො හැකි ය. එබැවින් ඔහු බෞද්ධ පඬිවරුන් මා විවේචනය කර ඇතැයි කීමට නිවට හා බොළඳ උත්සාහයක් දරයි.

රත්නපුරේ රාහුල හිමි ඒ ලිපිය ලියා කලකට පසුව ඉතාමත් අයහපත් සෞඛ්‍ය හේතුන් නිසා උපැවිදි වී ටික කලකින් මියගියේ ය. එබැවින් අද වික්‍රමබාහු කරුණාරත්නට පිළිතුරු දීමට එතුමා නැත. ඒ ලිපිය ලිවීමට පෙර ද පසු ද මට කිහිපවරක් ම උන්වහන්සේ හමු වී ඇත. උන්වහන්සේ මා සමඟ නිතර පවසා ඇති කරුණක් නම් මා ඉදිරිපත්කරන දර්ශනය මුල් බුදු දහම සමග එකගවන බව ය. එහෙත් උන්වහන්සේ අද ජීවතුන් අතර නොමැති බැවින් ඒ කියමන සනාථකිරීමට නො හැකිය. එහෙත් උන්වහන්සේ මා කෙරෙහි දැක්වූ ආකල්පය දන්නා අය ජීවතුන් අතර වෙති. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙහි උන්වහන්සේ සමග ඇදුරු මඬුල්ලෙහි සිටි ඇතැම් ආචාර්යවරු ද ඒ අතර වෙති. වික්‍රමබාහු කරුණාරත්නට අවශ්‍ය නම් එහි ගොස් අදාළ ආචාර්යවරුන් හමු වී ඒ දැනගත හැකි ය. එහෙත් එයට ද වඩා සුදුසුම ක්‍රමය මගේ ලෝකයෙහි පළ වී ඇති ලිපිය නැවත කියවීම ය. එහෙත් වික්‍රමබාහු කරුණාරත්නගේ අවාසනාවකට ඒ සඳහා විවේක බුද්ධියක් අවශ්‍ය වෙයි. වික්‍රමබාහු කරුණාරත්නට අනුව ඒ ලිපිය මගේ කෘති ගැන කෙරෙන විවේචනයකි. මට එයට දිය හැකි පිළිතුරක් නැතැයි ද මා පිළිතුරු දෙන්නේ චාර්වකට යැයි ද ඔහු කියයි. චාර්වක යනු එවකට කොළඹ විශ්වවිද්‍යාලයෙහි තිබූ ස්වාධීන ශිෂ්‍ය සංගමයට අයත්වූවකු හෝ අයත්වූ කිහිප දෙනකු හෝ විය යුතු ය. ඒ ලිපිය ද මගේ ලෝකය දෙවැනි මුද්‍රණයෙහි උපග්‍රන්ථයක් ලෙස පළකර එයට පිළිතුරක් ද සැපයුවෙමි. චාර්වක ලිපිය ලියා තිබුණේ ඊනියා භෞතිකවාදී ස්ථාවරයකිනි. දිගින් දිගට ම පළකිරීමට තරම් වැදගත්කමක් ඒ ලිපියෙහි නොතිබූ හෙයින් ලිපිය ද පිළිතුර ද තුන්වැනි මුද්‍රණයෙන් ඉවත්කෙළෙමි. දැන් ප්‍රශ්නයවන්නේ රාහුල හිමියන්ගේ ලිපියට පිළිතුරක් ලියා නැත්තේ ඇයි ද යන්න ය. වික්‍රමබාහු කරුණාරත්නගේ බුද්ධියට අනුව එයට

© Prof. Nalin De Silva

හේතුව මට එයට පිළිතුරක් නොමැති වීම ය. එහෙත් එයට හේතුව මා ඉදිරිපත්කරන කරුණු සමග ඒ ලිපිය එකග වීම බව ඔහුට නොතේරෙයි. උන්වහන්සේ කර ඇත්තේ මා විසින් ගොඩනගන දර්ශනය මුල් බුදුසමය සමග එකග වන බව පෙන්වීම ය. එසේ නොවන්නට ඒ ලිපිය තුන්වැනි මුද්‍රණයේත් පළකර පාඨකයාට ඒ කියවීමට සැලැස්වීමට තරම් බොරු නිහතමානීත්වයක් මට නැත. මගේ මත සමග විරුද්ධවන්නන් නිර්දය ලෙස විවේචනයකිරීම මගේ ප්‍රතිපත්තිය වෙයි. ඒ බුදුන්වහන්සේගේ ප්‍රතිපත්තිය නොවිය හැකිවුව ද මහෞෂධ පඬිතුමාගේ ප්‍රතිපත්තිය විය.

රත්නපුරේ රාහුල හිමියෝ මෙසේ කියති. (උපුටාගැනීම් මගේ ලෝකය දෙවැනි මුද්‍රණයෙනි.) “ 1. වාස්තවික ඥානය හා යථාභූත ඥානය 2. සංඛාර යන මාතෘකා පිළිබඳ නිකාය සාහිත්‍යය ඇසුරෙන් (මගේ ලෝකයෙහි දැක්වන දෑ පිළිබඳ - මගේ එකතුව) කරුණු ස්වල්පයක් පිරික්සීම මේ ලිපියේ අරමුණයි.” (141 වැනි පිටුව). නිකාය ග්‍රන්ථවලින් කරුණු ඉදිරිපත්කිරීමෙන් පසුව උන්වහන්සේ යථාර්ථය ගැන කියන්නේ කුමක් ද? එය 148 වැනි පිටුවෙහි සඳහන් වෙයි. “මෙසේ යථාර්ථය වාස්තවික වුවක් වශයෙන් මෙතෙක් ඉදිරියට ගෙන ආ අදහස මෙහි දී බැහැර කිරීමට සිද වෙයි. බුදු සමය ඉනුදු නොනවතියි. මෙම න - වාස්තවික යථාර්ථය ද තව දුරටත් විශ්ලේෂණයට ලක් කෙරේ. එහි දී වාස්තවිකත්වය නැති කරගත් යථාර්ථයට එහි ’ පැවැත්ම’ ද අහිමි කරනු ලැබේ .” අහෝ යථාර්ථයට ගිය කල. එයට එහි පැවැත්ම ද මුල් බුදු සමයෙන් (බුද්ධඝෝෂ හිමියන් හා ඉන්පසු ලියූ අටුවාවෙන් නොව) අහිමි කරනු ලැබ ඇත. මගේ ලෝකයෙහි ඥානවිභාගයෙහි හා මුල් බුදු සමයෙහි වෙනස කුමක් ද? සංඛාර ගැන රාහුල හිමියන් කියන දේ 152 හා 153 වැනි පිටුවල සඳහන් වෙයි. “ මේ ආදී දේශනාවන් මගින් පැහැදිලි කෙරෙන කරුණ නම් මීට ඉහත දී ද සඳහන් කරන ලද පරිදි ක්‍රියා හෙවත් සිද්ධීන්ට ස්ථිතික බවක් ආරෝපණය කොට නා නා සංකල්පයන් බවට අභිසංස්කරණය කිරීමේ ක්‍රියාවම සංඛාර බවයි. (මගේ ලෝකය කෘතිය උඩැක්කියක් වැනි ආසනයෙන් පටන්ගෙන ක්වොන්ටම් භෞතික විද්‍යාව දක්වා යමින් මේ කරුණ පැහැදිලි කරයි) ” මෙයට වඩා සහතිකයක් මට අවශ්‍ය නො වෙයි. ඒ සහතිකය මගේ ලෝකය මින් පසු මුද්‍රණවලට ද එකතුකිරීමට මම වගබලාගනිමි. මුල් බුදු සමයෙන් පැවතීම ද අහිමි කෙරුනු ඊනියා යථාර්ථය සියළු ආකාරයේ ඊනියා භෞතිකවාදීන්ගේ විඥානවාදී කෙප්පයක් පමණක් වෙයි.

වික්‍රමබාහු කරුණාරත්න ඉල්ලන් කන විට පෙරදිග සුළං සංවිධානය හා ජ වි පෙ ශිෂ්‍ය සංවිධානය වූ සමාජවාදී ශිෂ්‍ය සංගමය එකිනෙකාට බෙදාගෙන කයි. ජ වි පෙ ජාතිකත්ව කතා කීමට පටන්ගත්තේ නොබෝදා ය. අද නැවතත් ඔවුන්ට දයලෙක්තිය හා භෞතිකවාදය වැදගත් වී ඇත. ඔවුන් ක්වොන්ටම් භෞතිකය හා දයලෙක්තිය ගැන පොතක් ලියා ඇත්තේ වෙන කාහටවත් නොව මට පහරදීමට බව ඒ පොත ලිවී යැයි කියන පුබුදු නමැත්තකු පේරාදෙණියේ දී පවසා ඇත. කලකට පෙර ජාතික හෙළ උරුමයේ පුරෝගාමීන් වූ ජනතා මිතුරන් පෙන්වීමට තැත්කළේ මාක්ස්වාදයට හා භෞතිකවාදයට පහරදීම ගුණදාස අමරසේකර, සූරිය ගුණසේකර ආදී විශාල පිරිසක් අතින් කෙරුණු බව ය. ඔවුන් සැම විට ම මා විසින් කරනු ලැබ ඇති දේ අඩු තක්සේරුකළ ද ඊනියා භෞතිකවාදීහු තම ප්‍රධාන සතුරා කවුදැයි නිවැරදිව හඳුනාගනිති. (ජනතා මිතුරන් ද 1995 දී ද ජාතිකත්ව විරෝධී ස්ථාවරයක් දරමින් ඊනියා යුද්ධයට විරුද්ධ වූ බව අමතක නොකළ යුතු ය.) ජ වි පෙ ට හෝ පෙරදිග සුළං සංවිධානයට හෝ මට හැරෙන්නට වෙනත් අයට පහරදීමට අවශ්‍යතාවක් නැත. බටහිර භෞතිකවිද්‍යාව ද භෞතිකවාදී යැයි පිළිගන්නා ජ වි පෙරමුණේ භෞතිකවාදී ස්ථාවරය විමල් වීරවංශ මහතා පසුගිය දිනෙක සංකාරා චිත්‍රපටිය ගැන කර ඇති විවේචනයෙන් හෙළි වෙයි. (සංකාරා චිත්‍රපටිය ගැන ජාතිකත්වවාදී විවරණයක් සේන තෝරදෙනිය මහතා කර තිබුණි. පුද්ගලයකුගේ මනසෙහි ඇතිවන දෙපැත්තට ඇදීම් ගැන කීමට වෙනත් ආගමික පූජකවරයකුගේ චරිතය යොදාගැනීමට අධ්‍යක්ෂකවරුන්ට හා නිෂ්පාදකයන්ට නොසිතෙන්නේ ඇයි ද යන්න මෙරට ක්‍රියාත්මක වන බටහිර අධිපතිවාදී චින්තනය පසුබිම් කරමින් හැදෑරිය යුතු ය) පුබුදු නමැත්තා දන්නා ක්වොන්ටම් භෞතිකවිද්‍යාවක් හෝ භෞතිකයක් හෝ නොමැති බව ඉතා පහසුවෙන් පෙන්වා දිය හැකිය. ඔහුගේ පොතෙන් උපුටාගත් කොටස් මා ඇසුරෙහි ක්වොන්ටම් භෞතිකවිද්‍යාව හදාරණ සිසුන්ට කියවූ විට ඔවුහු සිනහසීමට පටන්ගත්හ. එය විහිළු ග්‍රන්ථයක් ලෙස නිර්දේශ කළ හැකි ය. පෙරදිග සුළං සංවිධානය ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය අනුව යමින් තරුණ මාක්ස්ගේ කෘති ඇසුරෙන් භෞතිකය බටහිර විද්‍යාවන්ගෙන් වෙන්කර සමාජයීය භෞතිකයකට පමණක් සීමාකිරීමට උත්සාහ දරන්නේ එමගින් හෝ මාක්ස්වාදය බේරාගැනීමට ය. එහෙත් ඇතැම් මාක්ස්වාදීන්ට අනුව ෆ්‍රැන්ජක්ෆර්ට් ගුරුකුලය විඥානවාදී වෙයි! භෞතිකවාදයට හා මාක්ස්වාදයට (මාක්ස්වාදීන්ට) ජනතාවගේ තබා තමන්ගේවත් විමුක්තිය සලසාගත නො හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva